**කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශය**

THE WORLD BANK
IBRD • IDA | WORLD BANK GROUP

# ඒකාබද්ධ ග්‍රාම - නගර සංවර්ධන සහ දේශගුණික තත්ත්වයන්ට ඔරොත්තුදීමේ ව්‍යාපෘතිය (IRDCRP)

# අභිලාෂ ප්‍රකාශ කිරීම සඳහා ඉල්ලීමයි

## (උපදේශන සේවා – ආයතන තෝරා ගැනීම)

**ණය අංකය : 7743-LK**

**පැවරුම් ශීර්ෂය : ඒකාබද්ධ ග්‍රාම නගර සංවර්ධන සහ දේශගුණික තත්ත්වයන්ට ඔරොත්තු දීමේ ව්‍යාපෘතිය සඳහා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ සහායක උපදේශක ආයතනයක් තෝරා ගැනීම සහ සේවයේ යෙදවීම.**

**ව්‍යාපෘතිය : ඒකාබද්ධ ග්‍රාම - නගර සංවර්ධන සහ දේශගුණික තත්ත්වයන්ට ඔරොත්තු දීමේ ව්‍යාපෘතිය (IRDCRP)**

**යොමු අංකය : MOALLI/IRDCRP/PMU/CS/QCBS/ISF/2025-01**

අන්තර්ග්‍රහණීය ආර්ථික පරිවර්තනයක් හරහා දේශගුණික තත්ත්වයන්ට ඔරොත්තු දීමේ හැකියාව ශක්තිමත් කිරීම සහ ග්‍රාමීය ජීවනෝපායන් වැඩිදියුණු කිරීම අරමුණු කරගත්, ලෝක බැංකු මූල්‍යාධාර ලබන ව්‍යාපෘතියක් වන IRDCRP සඳහා ශ්‍රී ලංකා රජයට ලෝක බැංකුව වෙතින් අරමුදලක් ලැබී ඇත. මෙම ව්‍යාපෘතිය ප්‍රධාන කොටස් 5 කින් සමන්විත වේ. කෘෂිකර්මාන්ත, පශු සම්පත්, වැවිලි සහ ධීවර අංශයන්හි අගය දාමයන් සංවර්ධනය කිරීම සඳහා නිෂ්පාදන සංවිධාන (POs) පුද්ගලික අංශයේ ක්‍රියාකාරීන් සහ රාජ්‍ය අංශයේ නියෝජිතායතන අතර ඵලදායී හවුල්කාරීත්වයන් (PPs) ගොඩනැගීම ව්‍යාපෘතියේ ප්‍රධාන අවධානය යොමු වී ඇති අංශයකි.

IRDCRP හි ව්‍යාපෘති කළමනාකරණ ඒකකය (PMU) විසින් යොමු අනුදේශයන්හි (TOR) විස්තර කොට ඇති උපදේශන සේවාවන් සැපයීම සඳහා තම අභිලාෂ ප්‍රකාශකරන මෙන් සුදුසුකම්ලත් උපදේශන සමාගම් වෙත ආරාධනා කරනු ලැබේ. යොමු අනුදේශ (TOR) https://www.agrimin.gov.lk වෙබ් අඩවියෙන් බාගත කරගත හැක.

**කෙටි ලැයිස්තුගත කිරීමේ නිර්ණායක**

කෙටි ලැයිස්තුගත කිරීමේ නිර්ණායකයන්ට පහත කරුණු ඇතුළත් වේ.

- ශ්‍රී ලංකාව තුළ පසුගිය වසර දහය (10) තුළ සමාන පැවරුම් සම්බන්ධයෙන් අදාළ පළපුරුද්දක් තිබීම සහ
- පැවරුම ක්‍රියාත්මක කිරීම, සමාගම සතු හැකියාව සහ නිපුණතාවය.

**බැඳියාවන් අතර ගැටුම**

අභිලාෂී උපදේශන සමාගම් විසින් සැබැඳියාවන් අතර ගැටුම පිළිබඳ ලෝක බැංකු ප්‍රතිපත්තිය දක්වා ඇති IPF ණය ගැණුම්කරුවන් සඳහා වන ලෝක බැංකු ප්‍රසම්පාදන රෙගුලාසි 2016 ජූලි (2023 නොවැම්බර් මස සංශෝධිත) කෙරෙහි අවධානය යොමු කළ යුතුය.

මීට අමතර මෙම පැවරුමට අදාළ සැබැඳියාවන් අතර ගැටුම පිළිබඳ පහත සඳහන් විශේෂ තොරතුරු වෙත කරුණාකර යොමු වන්න.

තෝරාගනු ලබන ආයතනය හෝ එම ආයතනය සෘජුව හෝ වක්‍රව පාලනය කරනු ලබන එම ආයතනයේ පාලනයට යටත් වන හෝ එම ආයතනය සමග පොදු පාලනය යටතේ පවතින යම් අනුබද්ධ ආයතනයක් වේ නම් මෙම ව්‍යාපෘතියේ ප්‍රතිපාදන මගින් මූල්‍ය පහසුකම් සපයනු ලබන උපදේශන සේවාවන් සැපයීම සඳහා ඔවුන් නුසුදුස්සන් කරනු ලැබේ. තවද මෙම කොන්ත්‍රාත්තුව යටතේ අනුයුක්ත කර ඇති කාර්ය මණ්ඩලය සහ තෝරාගත් ආයතනයේ ප්‍රධාන නිලධාරීන් සමග සමීප ව්‍යාපාරික හෝ පවුල් සබඳතා ඇති උපදේශකයින්, සැපයුම්කරුවන්, කොන්ත්‍රාත්කරුවන් සහ සේවා සපයන්නන් (ඔවුන්ගේ විශේෂඥයින් සහ වෙනත් සේවකයින්ද ඇතුලුව) සඳහා ව්‍යාපෘතිය මගින් මූල්‍ය පහසුකම් සපයනු නොලැබේ.

**සම්බන්ධ වීම්**

උපදේශන ආයතන තම සුදුසුකම් වර්ධනය කර ගැනීම සඳහා හවුල් ව්‍යාපාරයක් (JV) ලෙස හෝ උප – උපදේශකයින් ලෙස වෙනත් ආයතන සමග සම්බන්ධ විය හැක. ආයතනයකට වෙනත් ආයතන සමග මෙලෙස සම්බන්ධ විය හැකි නමුත් එක් අභිලාෂ පළ කිරීමේ ලියවිල්ලක් පමණක් ඉදිරිපත් කළ යුතුය. කෙටි ලැයිස්තුගත කිරීම අදාළ ආයතනයේ හෝ හවුල් ව්‍යාපාරයේ සුදුසුකම් මත පදනම් වේ.

**තෝරා ගැනීමේ ක්‍රමවේදය**

ලෝක බැංකු ප්‍රසම්පාදන රෙගුලාසිවල දක්වා ඇති ගුණාත්මකභාවය සහ පිරිවැය මත පදනම් වූ තෝරාගැනීමේ ක්‍රමවේදය (QCBS) අනුව උපදේශන ආයතන තෝරාගනු ලැබේ.

**තොරතුරු**

වැඩිදුර තොරතුරු පහත ලිපිනයෙන් කාර්යාලීය වේලාව තුළදී (පෙ.ව. 09.00 සිට ප.ව. 4.00 දක්වා දේශීය වේලාව) ලබාගත හැක.

පූර්ව අභිලාෂ ප්‍රකාශ කිරීම් (EOI) ඉදිරිපත් කිරීමේ රැස්වීමක් 2026 ජනවාරි 23 වන දින 10.00 පැයට IRDCRP හි ව්‍යාපෘති කළමනාකරණ ඒකකයේදී (PMU) පැවැත්වේ. ඉහත උපදේශන සේවාව සඳහා EOI ඉදිරිපත් කිරීමට උනන්දුවක් දක්වන ආයතන මෙම රැස්වීම සඳහා ඔවුන්ගේ සහභාගිත්වය, 2026 ජනවාරි 21 වන දින හෝ ඊට පෙර ඊ මේල් හරහා හෝ අතින් ගෙනවිත්, IRDCRP හි ව්‍යාපෘති කළමනාකරණ ඒකකය (PMU) වෙත ලිඛිතව දැනුම් දිය යුතුය.

අභිලාෂ ප්‍රකාශ කිරීම් 2026 පෙබරවාරි 02 වන දින 14.00 පැයට හෝ ඊට පෙර ලිඛිත ආකෘතියෙන් පහත ලිපිනය වෙත (පුද්ගලිකව – අතින් ගෙනවිත් හෝ ලියාපදිංචි තැපැල් මගින්) ගෙනවිත් භාරදිය යුතුය.


**ලිපිනය :** **ව්‍යාපෘති කළමනාකරණ ඒකකය,**
**ඒකාබද්ධ ග්‍රාම - නගර සංවර්ධන සහ දේශගුණික තත්ත්වයන්ට ඔරොත්තු දීමේ ව්‍යාපෘතිය (IRDCRP),**
**අංක 123/2. පන්නිපිටිය පාර, බත්තරමුල්ල.**
**ඊමේල් :** pmuirdcrp@gmail.com